# සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය

# අයදුම්පත් කැඳවීම

සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පලාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 07/2025 චක්‍ර ලේඛනය අනුව සුදුසුකම් සපුරා ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ පදිංචි අයවලුන්ගෙන් විවෘතව අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2026-08-24 සිට 2026-09 - 10 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් යොමු කරන ලෙසත් ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කර **"ගරු සභාපති, සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය, රිකිල්ලගස්කඩ"** යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ සමග අදාළ සහතික වල ඡායා පිටපත් එවිය යුතු අතර එසේ පිටපත් නොමැතිව, සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාළ සහතික වල ඡායා පිටපත් සමග මෑතකදී ගත් චරිත සහතික දෙකක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්ද එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට සියලුම සහතිකපත් වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.ආදර්ශ අයදුම්පත්‍රය සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයෙන් වැඩ කරන දිනයන් වල දී ලබා ගත හැකිය.

දැනට විවිධ සේවා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අයදුම්කරන්නේ නම් එම සමිතියේ මෑතක දී ගත් සේවා සහතිකයේ පිටපතක් සහ ඉල්ලුම් කරන තනතුරට ඔබව තෝරාගත හොත් දැනට සේවය කරනු ලබන සමිතියෙන් නිදහස් කරන බවට සමිතියෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කළයුතු අතර අයදුම්පත සමිතියේ සභාපති තුමා මගින් නිර්දේශ කර එවිය යුතුය.

පහත සියලු තනතුරු සඳහා තෝරා ගැනීමෙන් අනතුරුව ඇප මුදල් තැන්පත් කළ යුතුය.

## සමිති අභ්‍යන්තර විගණක - III

### පුරප්පාඩු තනතුරු - 01

- වැ.ප: අ :- E.L - 03.01
- වැ.ප : :- 37680-605X10-910X10-1210X10 = 64930/-
- වයස් සීමාව :- 18-45
- සුදුසුකම් :-

අ ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/පොත් තබන්නා තනතුරේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/කළමණාකරු (ව්‍යාපෘති )/කළමණාකරු - 1 (ස.ණ.ස සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 5ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ග්‍රාමීය බැංකු කළමණාකරු තනතුරේ වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම පරිපාලක (වෙළඳසැල් ) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

ආ **පිළිගත් ආයතනයක** මාස 9 කට නො අඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය /විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම සමග ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක /ග්‍රාමීය බැංකු කළමණාකරු තනතුරක / පොත් තබන්නා තනතුරක හෝ කළමණාකරු - 1 (ස.ණ.ස සමිති /වෙනත් මූල්‍ය ආයතන ) වසර 03ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම. / පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ඇ පිළිගත් විශ්ව විද්‍යාලයක / පිළිගත් ආයතනයක ගණකාධිකරණය / වාණිජ කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම/උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය /මානව සම්පත් කළමණාකරණය යන ඩිප්ලෝමාවන්ට අදාළව වසර 2 1/2 ක පාඨමාලවක් සමත් වී තිබීම.

ඈ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අදියර 1 (Charted level I) / ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර III (A.A.T.Level III ) සමත් වීම

## ග්‍රාමීය බැංකු කළමනාකරු III

### පුරප්පාඩු තනතුරු - 01

- වැ.ප: අ :- T.L 06.07
- වැ.ප :- 34650-545X10-820X10-1090X10 = 59200/-
- වයස් සීමාව :- 18-45
- සුදුසුකම් :-

අ පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/සහකාර ග්‍රාමීය බැංකු කළමණාකරු තනතුරේ වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ අයකැමි තනතුරක ගිණුම් සහකාර 1 තනතුරක 7කළමණාකරු 2 තනතුරක /ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/බැංකු) 1 තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම ගිණුම් සහකාර 2 තනතුරක /කළමනාකරු 3 තනතුරක /ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/ බැංකු )2 තනතුරක වසර 04ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

ආ **පිළිගත් ආයතනයක** ගණකාධිකරණය/බැංකු හා මූල්‍යකරණය ක්ෂුද්‍ර මූල්‍යකරණය /මේ හා සමාන විෂයයන් ඇතුළත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් සමත් වීම

**හෝ**

ඇ අ.පො.ස (උසස් පෙළ) වාණිජ අංශයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 04 කින් සමත් වීම (පැරණි නිර්දේශය)/විෂයයන් 01 කට සම්මාන සහිතව විෂයයන් 03 කින් (නව නිර්දේශය) එකවර සමත් වීම / සමුපකාර උසස් පෙළ සමත් වීම

**හෝ**

ඈ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ/හා ගණිතය /අංක ගණිතය / වාණිජ අංක ගණිතය ඇතුළු විෂයයන් 03 කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත් වීම /සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම

## පොත් තබන්නා තනතුර - III

### පුරප්පාඩු තනතුරු - 01

- වැ.ප.අ :- T.L - 06.08
- වැ.ප :- 34650-545X10-820X10-1090X10 = 59200/-
- වයස් සීමාව :- 18-45
- සුදුසුකම් :-

අ අයකැමි තනතුරක /ගිණුම් සහකාර | තනතුරක /ක්ෂේත්‍ර නිලධාරි (ව්‍යා /බැංකු)1 කළමණාකරු 2 තනතුරක වසර 5 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/කළමණාකරු 3 තනතුරක /ගිණුම් සහකාර 2 තනතුරක /ක්ෂේත්‍ර නිලධාරි (ව්‍යා/ බැංකු) 2 තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

ආ උසස් තාක්ෂණ ආයතනයේ /පිළිගත් ආයතනයක මාස 9 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම සමග අයකැමි තනතුරක /ගිණුම් සහකාර තනතුරක වසර 2ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

ඇ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් වාණිජ අංශයෙන් ගණකාධිකරණ විෂයය ඇතුළත්ව සම්මාන 03 ක් සහිත එකවර සමත් වීම (පැරණි නිර්දේශය)/අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් වාණිජ අංශයෙන් ගණකාධිකරණ විෂයය ඇතුළුව සම්මාන 02 ක් සහිතව එකවර සමත් වීම (නව නිර්දේශය)/සමුපකාර උසස් පෙළ දෙවරකට නොවැඩි කාලයක් තුළ සමත් වීම

## ගිණුම් සහකාර - III

### පුරප්පාඩු තනතුරු - 03

- වැ.ප.අ :- T.L 09.01
- වැ.ප :- 31800-490X10-740X10-985X10 = 53950/-
- වයස් සීමාව :- 18-45
- සුදුසුකම් :-

අ කළමණාකරු 3 (සණස සමිති / වෙනත් මූල්‍ය ආයතන ) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම, ගිණුම් සහකාර 2/ ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/බැංකු) 2 තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම වෙළඳසැල් කළමනාකරු තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම(පරිගණක ක්‍රියාකරු යතුරු ලේඛක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

ආ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයන් 04ක් සමත් වීම (පැරණි නිර්දේශය )/අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයන් 03 ක් සමත් වීම (නව නිර්දේශය)හෝ සමුපකාර උසස් පෙළ සමත් වීම අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් (පැරණි) නිර්දේශය /නව නිර්දේශය) වාණිජ අංශයෙන් සමත් වී තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**හෝ**

ඇ අ.පො.ස (සාමාන්‍ය පෙළ) අංක ගණිතය /වාණිජ/ගණිතය හා සිංහල භාෂාව ඇතුළු විෂයයන් 03 ට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් වීම/සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම.

## රියදුරු - III

### පුරප්පාඩු තනතුරු - 02

- වැ.ප.අ :- T.L 11.05
- වැ.ප :- 31050-475X10-720X10-950X10 = 52500/-
- වයස් සීමාව :- 18-45
- සුදුසුකම් :-

අ පිළිගත් ආයතනයක රියදුරු ලෙස බර වාහන පැදවීමේ වසරක සේවා පළපුරුද්දක් තිබීම/රිය සහායක ලෙස වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් සමග (මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍රය සහිතව ) බඳවා ගන්නා අවස්ථාවේ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය

**හෝ**

ආ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම සමග මෝටර් රථ කොමසාරිස් විසින් නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය බඳවා ගන්නා අවස්ථාවේ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය

**ගරු සභාපති,**
**සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**රිකිල්ලගස්කඩ.**
**දු.අ. 0812365580**
**2026.08.21**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED